# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

**2021 මැයි**

**03 වෙළුම 05 නිකුතුව**

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය




### මාසික ආනයන ක්‍රියාකාරිත්වය




2021 වසරේ මැයි මාසයේ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 892ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 52.0කින් ඉහළ ගියේය.

2021 වසරේ මැයි මාසයේ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,607ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 61.7කින් ඉහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)




### වෙළඳ හිඟය (එ.ජ. ඩොලර් මිලියන)




2021 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී අපනයන ආදායම සහ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, පිළිවෙළින්, සියයට 33.3කින් සහ සියයට 26.2කින් ඉහළ ගියේය.

වෙළඳ ගිණුමේ හිඟය 2020 වසරේ මැයි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 407ට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 716ක් දක්වා වැඩි විය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2021 ජන.- මැයි)

### අපනයන (එ.ජ. ඩොලර් මිලියන)




### ආනයන (එ.ජ. ඩොලර් මිලියන)



# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන.-මැයි)




### අපනයන පරිමා දර්ශකය - (ජන.-මැයි)




සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී අපනයන ආදායම 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය.

සියලුම ප්‍රධාන කාණ්ඩවල අපනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී අපනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන

### කෘෂිකාර්මික අපනයන ආදායම




### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-මැයි)




### තේ සහ රබර් මිල ගණන් *




* කොළඹ වෙන්දේසි මිල ගණන් මත පදනම් වන අතර 2020 වසරේ අප්‍රේල්-අගෝස්තු කාලපරිච්ඡේදයේ දී රබර් වෙන්දේසි මිල ගණන් නොමැත.

ප්‍රධාන වශයෙන් තේ, කුළුබඩු, පොල් සහ මුහුදු ආහාර අපනයන ආදායම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී කෘෂිකාර්මික අපනයන ආදායම 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගියේය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත අපනයන ආදායම සුළු වශයෙන් පහත වැටුණි.

# කාර්මික අපනයන

## කාර්මික අපනයන ආදායම




## කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන.-මැයි)




## නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්




2021 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී කාර්මික අපනයන ආදායම 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් රෙදිපිළි හා ඇඟලුම්, රබර් නිෂ්පාදිත සහ ආහාර, පාන වර්ග හා දුම්කොළ අපනයන ආදායම ඉහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මෙම කාලපරිච්ඡේදය තුළ දී ඛනිජතෙල් නිෂ්පාදිත අපනයන ආදායම වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත පහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

## ආනයන ක්‍රියාකාරිත්වය - (ජන.-මැයි)




## ආනයන පරිමා දර්ශකය (ජන.-මැයි)




2021 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම 2020 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන් අන්තර් භාණ්ඩ හා ආයෝජන භාණ්ඩ ආනයන වියදම් ඉහළ යෑම හේතු වූ අතර, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සුළු වශයෙන් අඩු විය. මේ අතර, සලකා බලන කාලපරිච්ඡේදය තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමාව පහළ ගිය ද, ආයෝජන භාණ්ඩ හා අන්තර් භාණ්ඩ ආනයන පරිමාවන් ඉහළ යෑම හේතුවෙන්, ආනයන පරිමා දර්ශකය ඉහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන

පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම




පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය
(ජන.-මැයි)




සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ
සාමාන්‍ය ආනයන මිල ගණන්




පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සුළු වශයෙන් පහත වැටුණු අතර, බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, ගෘහ උපකරණ සහ විදුලි සංදේශ මෙවලම් ආනයන වියදම් ඉහළ ගිය ද, පෞද්ගලික රථවාහන සහ රෙදිපිළි හා උපාංග ඇතුළු ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන පහත වැටීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. කෙසේ වුවත්, එළවළු, කිරි නිෂ්පාදිත, කුළුබඩු සහ මුහුදු ආහාර ආනයන වියදම් පහළ යෑම හමුවේ වුව ද, සීනි හා රසකැවිලි සහ තෙල් හා මේද ආනයනය කිරීමේ වියදම ඉහළ යෑමත් සමඟ ආහාර හා පාන වර්ග ආනයන වියදම ඉහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන

අන්තර් භාණ්ඩ ආනයන වියදම




අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



### අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-මැයි)




### බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)




*2021 වසරේ මාර්තු මාසයේ දී බොරතෙල් ආනයනය කර නැත.

විශේෂයෙන්ම ඉන්ධන, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, රසායනික නිෂ්පාදිත සහ මූල ලෝහ ඇතුළු සියලුම අන්තර් භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, 2021 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව අන්තර් භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන

### ආයෝජන භාණ්ඩ ආනයන වියදම




### ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.-මැයි)




ප්‍රධාන වශයෙන්ම, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ ගොඩනැගිලි ද්‍රව්‍යවල ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන්, පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව, 2021 වසරේ මැයි මාසයෙන් අවසාන වන මාස පහ තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | මැයි- 20 | මැයි - 21 | වෙනස (%) | ජන. -මැයි 2020 | ජන.-මැයි 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **183.0** | **199.3** | **8.9** | **809.8** | **1,028.7** | **27.0** |
| එයින් | තේ | 108.3 | 109.2 | 0.9 | 456.7 | 526.6 | 15.3 |
| | පොල් | 27.9 | 34.0 | 22.2 | 112.6 | 157.7 | 40.1 |
| | කුළුබඩු | 19.3 | 25.2 | 30.5 | 82.4 | 161.3 | 95.9 |
| | මුහුදු ආහාර | 11.5 | 15.0 | 30.5 | 74.8 | 90.6 | 21.1 |
| **කාර්මික අපනයන** | | **401.0** | **687.0** | **71.3** | **2,695.8** | **3,636.4** | **34.9** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 220.1 | 372.4 | 69.2 | 1,540.2 | 2,071.9 | 34.5 |
| | රබර් නිෂ්පාදිත | 49.4 | 88.9 | 80.1 | 269.7 | 406.8 | 50.8 |
| | ඛනිජතෙල් නිෂ්පාදිත | 10.6 | 33.3 | 213.7 | 202.8 | 155.4 | -23.4 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 29.3 | 38.9 | 32.9 | 156.1 | 206.3 | 32.1 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 20.8 | 40.9 | 96.3 | 116.3 | 196.9 | 69.4 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 6.8 | 16.0 | 133.5 | 61.6 | 111.0 | 80.2 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 2.6 | 2.9 | 11.6 | 20.2 | 17.8 | -11.8 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **2.7** | **5.5** | **103.1** | **13.0** | **27.0** | **108.1** |
| **මුළු අපනයන** | | **586.7** | **891.7** | **52.0** | **3,518.6** | **4,692.0** | **33.3** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | මැයි- 20 | මැයි - 21 | වෙනස (%) | ජන. -මැයි 2020 | ජන.-මැයි 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **264.4** | **253.6** | **-4.1** | **1,533.0** | **1,530.1** | **-0.2** |
| ආහාර හා පාන වර්ග | | 122.1 | 121.0 | -0.9 | 685.4 | 749.8 | 9.4 |
| එයින් | එළවළු (අ) | 30.3 | 33.5 | 10.6 | 175.9 | 171.5 | -2.5 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | | 142.3 | 132.6 | -6.8 | 847.6 | 780.2 | -8.0 |
| එයින් | පෞද්ගලික රථවාහන | 47.5 | 0.5 | -99.0 | 264.2 | 4.0 | -98.5 |
| **අන්තර් භාණ්ඩ** | | **486.3** | **1,045.4** | **115.0** | **3,602.0** | **5,111.1** | **41.9** |
| එයින් | ඉන්ධන | 62.9 | 330.5 | 425.5 | 1,133.0 | 1,720.9 | 51.9 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 121.0 | 235.7 | 94.7 | 889.9 | 1,174.3 | 32.0 |
| | පොහොර | 29.8 | 13.0 | -56.3 | 84.8 | 95.2 | 12.3 |
| | තිරිඟු හා ඉරිඟු | 39.8 | 20.8 | -47.8 | 128.7 | 141.0 | 9.6 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **243.1** | **308.4** | **26.9** | **1,484.1** | **1,714.3** | **15.5** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 158.1 | 183.2 | 15.9 | 843.6 | 1,096.2 | 30.0 |
| **මුළු ආනයන** | | **993.8** | **1,607.4** | **61.7** | **6,619.1** | **8,355.5** | **26.2** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | මැයි- 20 | මැයි - 21 | වෙනස (%) | ජන. -මැයි 2020 | ජන.-මැයි 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -407.1 | -715.7 | - | -3,100.5 | -3,663.5 | - |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ආ)

| කාණ්ඩය | | මැයි- 20 | මැයි - 21 | වෙනස (%) | ජන. -මැයි 2020 | ජන.-මැයි 2021 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 81.7 | 124.1 | 52.0 | 97.9 | 130.6 | 33.3 |
| | පරිමා දර්ශකය | 88.8 | 137.4 | 54.7 | 106.6 | 145.0 | 35.9 |
| | මිල දර්ශකය | 91.9 | 90.3 | -1.8 | 91.8 | 90.1 | -1.9 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 88.9 | 143.9 | 61.7 | 118.5 | 149.6 | 26.2 |
| | පරිමා දර්ශකය | 101.0 | 147.1 | 45.7 | 139.5 | 167.5 | 20.0 |
| | මිල දර්ශකය | 88.1 | 97.8 | 11.0 | 84.9 | 89.3 | 5.2 |
| **වෙළඳ මිල අනුපාතය** | | 104.4 | 92.4 | -11.5 | 108.2 | 100.9 | -6.7 |

(අ) පරිප්පු, ළූණු,අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.
(ආ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද